පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක:- එන්සීපී/2005/08

මගේ අංකය:-එන්සීපී/සීඑස්/පීටී/1/104

සියළුම ලේකම්වරුන්,
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්,
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**<u>උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය මගින් සැපයෙන සේවාවන් ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන වලට සැපයීම.</u>**

උතුරු මැද පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයට අනුබද්ධව ප්‍රඥප්තියක් මගින් ස්ථාපිත කර ඇති උතුරු මැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය මගින් පහත සඳහන් සේවාවන් සැපයීමට අවශ්‍ය පහසුකම් සූදානම් කර ඇති බව එම ආයතනයේ සභාපති විසින් මා වෙත ඇති 2005.07.27 දැනැති ලිපිය මගින් දැනුම් දී ඇත.

1. සියලුම මුද්‍රණ කටයුතු
2. වාහන සේවා කිරීම
3. ලී බඩු උපකරණ නිපදවා සැපයීම (පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ඇතුලුව)
4. සියලුම වාහන සඳහා ටයර්, ටියුබ් සහ බැටරි සැපයීම.

02. ඉහත කාර්යයන් විවිධ ආයතන විසින් විවිධ මිල ගණන් යටතේ සිදු කිරීම නිසා පළාත් සභාවේ අරමුදල් අනිසි ලෙස පිටස්තර ආයතන වලට බැහැර වන බව මා වෙත වාර්තා වී ඇත. ඒ පිළිබඳව පසුගිය 2005.06.01 දින පැවත්වූ අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී දීර්ඝ වශයෙන් සාකච්ඡා කරන ලදුව තීරණ අංක 3.2 ට අනුව ඉහත සඳහන් සේවාවන්, පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන වලට ටෙන්ඩර් පරිපාටියෙන් බැහැරව කටයුතු කිරීමට අනුමැතිය ලබා දී ඇත.

03.ඒ අනුව ඔබ ආයතනයේ ඉහත අවශ්‍යතාවයන් ඍජුව සංවර්ධන හා නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය මගින් කරවා ගන්නා ලෙසත් උපදෙස් දෙමි.

04. එකී ආයතනය විසින් ඔබගේ ඇණවුමට අනුව විධිමත් පරිදි වැඩ පත්‍රිකා මගින් වැඩ පැවරීම කර නිසි පරිදි සේවාවන් සැපයීමට කටයුතු කළ යුතුය.

05. සේවාවන් අවසන් වූ වහාම විධිමත් පරිදි බිල්පත් එම ආයතනය මගින් ලබා ගැනීමටත් සේවාවන් ලබාගත් දින සිට 07 ක් ඇතුලත යන්ත්‍රෝපකරණ ඒජන්සියට ගෙවිය යුතු බිල්පත්‍ර පියවීමටත්, අදාළ ආයතන ප්‍රධානියා කටයුතු කළ යුතුය.

06. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2005.11.01 දින සිට බලපැවත්වේ.

**ජේ.එම්.කරුණාරත්න,**
ප්‍රධාන ලේකම්,
උතුරු මැද පළාත.

පිටපත්:-1. සභාපති, සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ - ඔබගේ 2005.07.27 දිනැති ලිපිය අනුව දැ.ගැ.ස ඒජන්සිය, පුලියන්කුලම, අනුරාධපුර .
2. විගණකාධිපති - දැ.පි
3. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ - දැ.ගැ.ස.